# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## පිරිසිදුකිරීම් භාරකරු (Custodian) [කාන්තා / පුරුෂ]

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරයි.**

කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පිරිසිදුකිරීම් භාරකරු තනතුරට සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තෝරාගනු ලබන තැනැත්තා, ඔහු/ඇය හට ලබාදෙන උපදෙස් පරිදි තානාපති කාර්යාලයේ විවිධ අංශ වල මෙන්ම එක්සත් ජනපද රජයේ පූර්ණ හෝ කල්බදු අයිතිය යටතේ පවතින දේපළ වල විශාල පරාසයකින් යුත් පිරිසිදු කිරීමේ කාර්යයන් සිදුකළ යුතු වේ. එසේම තනතුර දරන්නා යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ හෝ, භාරකාර/පිරිසිදු කිරීම් නායකයාගේ සේවා මඟපෙන්වීම යටතේ කටයුතු කළ යුතුය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇ. ඩො 278.67 කි.**

[කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මඟින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2024 ජනවාරි 29 වනදා වන විට විනිමය අනුපාතය ඇමෙරිකානු ඩොලර් 1 = රු. 317.60 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.]

**<u>සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:</u>**

1. **අධ්‍යාපනය** - ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණකර තිබිය යුතුය (අයදුම්කරන්නා 10 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා තිබිය යුතුය.) **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.)**

2. **පූර්ව රැකියා පළපුරුද්ද** - අවම වශයෙන් මාස හයක භාරකරු හෝ ගෘහ සේවක තනතුරක සේවා පළපුරුද්ද තිබිය යුතුය. **(අදාළ සේවා සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.)**

3. **භාෂා ප්‍රවීණතාවය** - I මට්ටමේ (ප්‍රාථමික දැනුම) ඉංග්‍රීසි කියවීම, ලිවීම, කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. **(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
   II මට්ටමේ (සීමිත දැනුම) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4. **රැකියා දැනුම** - පිරිසිදු කිරීම සහ ගෘහ සේවයට යොදාගන්නා ද්‍රව්‍ය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. නව පිරිසිදුකාරක, පිරිසිදුකිරීමේ ක්‍රම සහ උපකරණ වල නව ප්‍රවණතාවන් පිළිබඳ දැනීමක් තිබිය යුතුය. පිරිසිදු කිරීමට යොදාගන්නා රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව භාවිතා කරන ආකාරය පිළිබඳ අවබෝධයක් තිබිය යුතු අතර අනාරක්ෂිත භාවිතයන් හඳුනාගැනීම සහ වාර්තා කිරීම සිදුකළ යුතුය. රාජකාරී අනතුරු මෙන්ම රසායනික පිරිසිදුකාරක ආරක්ෂිතව භාවිතය ඇතුලු වෘත්තීය ආරක්ෂණ නීති සහ රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.
   ගිනි නිවීමේ උපකරණය වැනි ආරක්ෂක උපකරණ භාවිතා කරන ආකාරය පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.

5. **නිපුණතා සහ හැකියාවන්** -
   කායශ්‍රමය යොදවා කළ හැකි මූලික කාර්යයන් සිදුකිරීමේ හැකියාව තිබිය යුතුය.
   තමන්ගේ මෙන්ම අනෙක් අයගේත් ආරක්ෂාව තහවුරු වන පරිදි පිරිසිදු කිරීමේ මෙවලම් සහ උපකරණ භාවිතා කිරීමට හැකිවිය යුතුය.
   ද්‍රව්‍යයන් එසවීම සහ එහා මෙහා කිරීමට හැකිවිය යුතු අතර ඇස් - අත් සමායෝජනය කාර්යක්ෂම විය යුතුය.
   දිගු කාල සීමාවක් සිටගෙන සහ / හෝ නැවී වැඩ කිරීමටද, කුඩා ඉඩ ප්‍රමාණ වල කාර්යයන් කිරීමටද සිදුවේ.
   පාරිභෝගිකයින් සමඟ මනා ලෙස සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය අන්තර්පුද්ගල හැකියාවන් තිබිය යුතුය.

**<u>අයදුම් කරන ආකාරය:</u>**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**<u>අවශ්‍ය ලේඛන:</u>**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාල අධ්‍යාපන සහතික
- අදාල සේවා / කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම් පත / විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**<u>තැපැල් හෝ ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.</u>**

ඔබගේ අයදුම්පත **2024 මාර්තු 08** වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.